# බැඩ්මින්ටන් නීති රීති

(2006 මැයි මාසයේදී සංශෝධනය කල නීති*)

# Laws of Badminton

(New Rally Points Scoring System –May 2006*)





**සුනිල් වික්‍රම තෙන්නකෝන්**
Level II Qualified (NOC / SLBA) Badminton Coach
National Badminton Umpire (Grade 2) – SLBA
B.Sc. (Hons.), Chartered, Fellow – CIPD (U.K.)

**සුමුදු ප්‍රසන්න තෙන්නකෝන්**
Level II Qualified (SLBA) Badminton Coach
B.Sc. (Hons.) (Physics)



http://www.badmintonfriends.com

http://badmintonfriend.googlepages.com

# .. පටුන ....


| | | |
|---|---|---|
| 1. | බැඩ්මින්ටන් පිටිය හා උපකරණ (Badminton Court & Court Equipments) | 3 |
| 2. | කාසියේ වාසිය ( Toss) | 5 |
| 3. | ලකුණු තැබීම පිළිබඳ මූලික නීතිය (Basic Rule of Scoring) * | 5 |
| 4. | තරඟය හා තරඟ වට (Match & Games)* | 5 |
| 5. | තරඟ හා තරඟ වට ජයග්‍රහණය (Winning Match & Games)* | 5 |
| 6. | තරඟ වාරයක් දීර්ග කිරීම (Long Game) * | 5 |
| 7. | නිවැරදි පිරිනැමීමේ පිළිවෙත - (correct service) | 6 |
| 8. | පිරිනැමීම් පිටි වැරදි (Service court errors) කිහිපයක් | 7 |
| 9. | පිටියේ නිවැරදි පැත්තේ සිට පිරිනැමීම (Serving from Correct Service Court) * | 7 |
| 10. | පිරිනැමුම් පැත්ත මාරුවීම (Changing Service Court) * | 8 |
| 11. | විවේකකාල (Intervals) සහ පැති මාරුවීම් (Change Sides)* | 9 |
| 12. | වැරදි (Faults) | 10 |
| 13. | ක්‍රීඩා අතුරුවාරය (rally) නැවත ඇරඹීමට (Lets) ඉඩදීම | 10 |
| 14. | පුහුණුකරුගෙන් (Coach) උපදෙස් ලබාගැනීමට හා පිටියෙන් පිටතට යෑම (Advice / Leaving Court )* | 10 |
| 15. | රේඛා විනිසුරුවන්ගේ (Line Judges) හා පිරිනැමීමේ විනිසුරුගේ (Service Judge) තීරණ වෙනස් කිරීමේ බලය. | 11 |
| 16. | විනිසුරුවරයාගේ වචන මාලාව (vocabulary) | 11 |
| 17. | රේඛා විනිසුරුවන් (line judges) හා පිරිනැමීම් විනිසුරු (service judge) ප්‍රධාන විනිසුරු (umpire) සමග සිදුකරණ කරන සංඥා (signals) | 13 |
| 18. | යුගල තරඟයක තරඟ අතුරු වට (rallies) කිහිපයකදී පිරිනැමුම් පැත්ත මාරුවීම හා ලකුනු හිමිවන ආකාරය Changing Service Courts & Scoring in Doubles | 14 |


***

## 1. බැඩ්මින්ටන් පිටිය හා උපකරණ (Badminton Court & Court Equipments)




පිටියේ විකර්ණයේ දිග ( A සිට B දක්වා)= 14.723 m

## පිහාටු පන්දුවේ (Shuttle Cock) යෝග්‍යතාව පරීක්ෂා කිරීමේ සීමා ඉරී




## බැඩ්මින්ටන් දැල (Badminton Net)




## බැඩ්මින්ටන් පිත්ත (Badminton Racket)




සාමන්‍ය බර 90g- 150g අතර වේ

## පිහාටු පන්දුව (Shuttle Cock)




- Skrit කොටසෙහි පිහාටු 16ක් තදින් සිටින සේ වෘත්තාකාරව සවිකර ඇත
- Skrit කොටස කෘතිමවද (Nylon) සාදනු ලබයි

## 2. කාසියේ වාසිය ( Toss)

2.1. කාසියේ වාසිය අත්කරගත් (පිල) ක්‍රීඩකයා පහත දැක්වෙන අවස්ථා දෙකෙන් එකක් තෝරාගත යුතුය.

- මුලින් පිරිනැමීම හෝ පිරිනැමීම ලැබීමට සූදානම්වීම ( serving first or receiving first )
- පිටියේ වාතාවරණය අනුව තමාට ක්‍රීඩා කිරීමට සුදුසු පැත්තක් තෝරා ගැනීම ( choice of the side )

## 3. ලකුණු තැබීම පිළිබඳ මූලික නීතිය (Basic Rule of Scoring) *

3.1. පිලකට (side) ලකුණක් ලැබෙන්නේ කුමන ක්‍රීඩකයෙක් හෝ ක්‍රීඩකයන් 02 ක් (යුගල තරඟ වලදී ) අදාල තරඟ අතුරු වටය (rally) ජයග්‍රහණය කල විටය.

3.2. වෙනත් වචන වලින් කිවහොත් පිරිනැමීම සිදුකරන්නා (server) තරඟ අතුරු වටය (rally) ජයග්‍රහණය කල විට, ඔහුට ලකුණක් ලැබෙන අතර, පිරිනැමීම ලබන්නා (receiver) තරඟ අතුරු වටය (rally) ජයග්‍රහණය කල විට, ඔහුට ලකුණක් ලැබෙන්නේය.

3.3. මෙය යුගල තරඟ වලදී ද අදාල වේ.

## 4. තරඟය හා තරඟ වට (Match & Games)*

4.1. සම්පූර්ණ තරඟයක් (Match) තරඟ වට (Games) 3 කින් සමන්විත වේ

4.2. තරඟ වටයක් ( Game ) අවසන් වන ලකුණු සංඛ්‍යාව

| | | |
|---|---|---|
| ගැහැණු / පිරිමි කේවල (Women's / Men's Singles) | = | 21 |
| ගැහැණු / පිරිමි යුගල (Women's / Men's Doubles) | = | 21 |
| මිශ්‍ර යුගල (Mixed Doubles) | = | 21 |

## 5. තරඟ හා තරඟ වට ජයග්‍රහණය (Winning Match & Games)*

5.1. පළමුවෙන් ලකුණු 21 ගත් පිල (side), තරඟ වටයේ (game) ජයග්‍රහණය කල පිල වශයෙන් නම් කරයි. ( **7..1 විශේෂ අවස්ථාවේදී හැර**)

5.2. තරඟ වට (games) 03කින් 02ක් ජයගත් පිල (side), තරඟ යේ (match) ජයග්‍රහණය කල පිල වශයෙන් නම් කරයි.

## 6. තරඟ වාරයක් දිර්ඝ කිරීම (Long Game) *

**6.1. දෙපිලේ ( 02 Sides ) ලකුණු තත්වය 20 - 20 ( 20 All ) වන විට**

පළමුවෙන් අනික් පිලට වඩා ලකුණු 02 ක් ලබා ගෙන ඉදිරියෙන් ( 2 points lead first ) සිටි පිල, තරඟ වටය (game) ජයග්‍රහණය කරයි.

*Example* 1:- ( 20 – 20 ) ➡ ( 21 – 20 ) ➡ ( 22 – 20 )
*Example* 2 :- ( 20 – 20 ) ➡ ( 20 – 21 ) ➡ ( 21 – 21 ) ➡….
(21 – 22 ) ➡ (21 –23)

**6.2.** **<u>කෙසේ වුවද දෙපිලේ (02 sides) ලකුණු තත්ත්වය 29 - 29 ( 29 all ) වන විට</u>** <u>පළමුවෙන්</u> ලකුණු 30 ක් ලබාගත් පිල, තරඟවටයේ (Game) ජයග්‍රාහී පිල වශයෙන් නම් කරයි.

*Example :-* ( 29 – 29 ) ➔ ( 30 – 29 )

( මෙය යුගල තරඟ වලදී ද අදාල වේ. )

## 7. <u>නිවැරදි පිරිනැමීමේ පිලිවෙත - (correct service)</u>

7.1. නිවැරදි පිරිනැමීමකදී අනුගමනය කල යුතු මූලික නීති පහත රූප සටහන යටතේ විස්තර කර ඇත.

| | | |
|---|---|---|
| **P** |  | i පිත්තේ (racket) ශීර්ෂය (head) සම්පූර්ණයෙන්ම පිරිනමන්නාගේ (server) අතට යටින් තිබිය යුතුය. (මැණික් කටුවට) |
| **Q** | | <u>P සහ Q අවස්ථා නීති විරෝධී පිරිනැමීම් ලෙස සැලකේ.</u> |
| **R** | | <u>R අවස්ථාව නිවැරදි පිරිනැමීමකි.</u><br>(source :- www.badminton-information.com ) |

ii. ෂටලය (shuttlecock) පිත්තේ වදින අවස්ථාවේදී ෂටලයේ **<u>සම්පූර්ණ කොටස</u>** පිරිනමන්නාගේ (server) ඉඟටියට (waist) **<u>යටින්</u>** තිබිය යුතුය. <u>මෙහිදී ඉඟටිය (waist) ලෙස සලකනු ලබන්නේ ක්‍රීඩකයාගේ දෙඅතෙහි වැලමිට් සන්ධි දෙක යාකරන සේ අඳින ලද කල්පිත රේඛාවකි.</u>

iii. ෂටලය (shuttlecock), පිරිනමන්නාගේ (server) පිත්තේ වදින අවස්ථාව තෙක්, පාද වලින් කුමන කොටසක්වත් ස්ථිතිකව (stationary) එනම් චලනය වීමකින් තොරව, බැඩ්මින්ටන් පිටියේ ස්පර්ශවී තිබිය යුතුය.

7.2. එසේම කේවල සහ යුගල තරඟයක නිවැරැදිව පිරිනැමීමක (service) දී අනුගමනය කල යුතු shuttlecock <u>පතිත කලයුතු කොටුව</u> එනම් <u>service court</u> වෙන වෙනම හඳුනා ගැනීම සඳහා පිටු අංක 5 සහ 6 බලන්න.

## 8. පිරිනැමීම් පිටි වැරදි (Service court errors) කිහිපයක්

8.1. පහත දැක්වෙන අවස්ථා වලදී විනිසුරුවරයා (umpire) විසින් පිරිනැමීම් පිටි වැරදි ප්‍රකාශයට පත් කරයි.

(a) තමාගේ වාරයෙන් පිට පිරිනැමීම (service) සිදුකිරීම. (serve out of turn)

(b) 10.1 10.2 ඡේදයේ විස්තර කර ඇති පරිදි වැරදි පිරිනැමීම පිටියක (wrong service court) සිට පිරිනැමීම (service) සිදුකිරීම. **හෝ**

(c) පිරිනැමීම ලබන්නා (receiver) වැරදි පිරිනැමීම පිටියක (wrong service court) සිට පිරිනැමීම පිලිගැනීම සහ ෂටලය (shuttle cock) ඔහුගේ පිත්තේ වැදීම.

**8.2.** ඉහත සඳහන් (a), (b) සහ (c) හි දැක්වෙන වැරදි (service court errors) ඊළඟ පිරිනැමීම (next service) ආරම්භ කල පසුව අනාවරණය වුවහොත් එම වැරදි නිවැරදි නොකල යුතුය.

8.3. එහෙත් , (a), (b) සහ (c) හි සඳහන් වැරදි ඊළඟ පිරිනැමීම ආරම්භ කිරීමට පෙර අනාවරණය වුවහොත් පහත සඳහන් පරිදි කටයුතු කල යුතුය.

(a) ක්‍රීඩකයන් දෙපාර්ශවය විසින්ම ඉහත සඳහන් පිරිනැමීම වැරදි එකවිට සිදුකර ඇත්නම්, එය නැවත **(let)** පිරිනැමීමක් වශයෙන් සලකනු ලැබේ.

(b) පිරිනැමීම් වැරද්ද සිදුකල පාර්ශවය ක්‍රීඩා අතුරු වාරයේදී (rally) ජයග්‍රහණය කලත් , එය නැවත **(let)** පිරිනැමීමක් ලෙස සලකනු ලැබේ.

(c) පිරිනැමීම් වැරැද්ද සිදුකල පාර්ශවය ක්‍රීඩා අතුරු වාරයේදී (rally) පරාජයට පත්වුවහොත් එම වැරැද්ද නිවැරදි නොකල යුත්තේය.

## 9. පිටියේ නිවැරදි පැත්තේ සිට පිරිනැමීම (Serving from Correct Service Court) *

**9.1. කේවල තරඟ සඳහා (Singles)**

තමාගේ ලකුණු සංඛ්‍යාව ඉරට්ටේ වනවිට දකුණු අත පැත්තේ කොටුවේ ( right service court) සිට පිරිනැමීම කල යුතු අතර, ලකුණු සංඛ්‍යාව ඔත්තේ වන විට වම් අත පැත්තේ කොටුවේ (left service court) සිට පිරිනැමීම කල යුතුය.



**9.2. <u>යුගල තරඟ සඳහා (Doubles)</u>**

තම කණ්ඩායමේ ලකුණු සංඛ්‍යාව <u>ඉරට්ටේ</u> වනවිට <u>දකුණු අත පැත්තේ කොටුවේ</u> ( right service court) සිටින ක්‍රීඩකයා පිරිනැමීම කල යුතු අතර, ලකුණු සංඛ්‍යාව <u>ඔත්තේ</u> වන විට <u>වම් අත පැත්තේ කොටුවේ</u> (left service court) සිටින ක්‍රීඩකයා පිරිනැමීම කල යුතුය.




## 10.<u>පිරිනැමුම් පැත්ත මාරුවීම (Changing Service Court) *</u>

### 10.1. කේවල <u>තරඟ සඳහා (Singles)</u>

10.1.1. තරඟ වටය (game) ආරම්භයේදී එනම්, ලකුණු තත්වය 0 - 0 ( love all ) වන විට <u>පිරිනැමීම සිදු කරන්නා</u> (server) <u>දකුණු පැත්තේ</u> (right Service Court ) සිට තරඟවටය ( game ) ආරම්භ කරයි.

10.1.2. <u>පිරිනැමීම ලබන්නා</u> (receiver) ලකුණක් ගත්විට (ලකුණු තත්වය 1 - 0 ) , ඔහු ඊලඟ තරඟ අතුරු වටයේදී (rally) <u>ප්‍රථම වරට වම්පැත්තේ</u> (left Service Court) සිට පිරිනැමීම (service ) ආරම්භ කරයි.

10.1.3. පිරිනැමීම සිදු කරන්නා (server) අදාල අතුරු තරඟ වටය (rally) ජයග්‍රහණය කළේ නම් ඔහුට ලකුණක් ලැබෙන අතර, ඔහු නැවත පිරිනැමීම (next service) සිදු කළ යුත්තේ තෝරා ගැනීමට ඉතිරි වී ඇති <u>(alternative)</u> වම් පැත්ත හෝ දකුණු පැත්ත කොටුවේ (left service court **<u>or</u>** right service Court ) සිටය.

10.1.4. පිරිනැමීම ලබන්නා (receiver ) අදාල තරඟ අතුරු වටය (rally) ජයග්‍රහණය කළ හොත් ඔහුට ලකුණක් හිමි වන අතර ඔහු නව පිරිනැමීම සිදු කරන්නා (new server) බවට පත් වේ. ඔහුගේ ලකුණු තත්වය (එනම් ඔත්තේ හෝ ඉරට්ටේ ) අනුව, <u>පිළිවෙලින්</u> වම් පැත්තේ හෝ දකුණු පැත්තේ (left service court or right service court ) සිට පිරිනැමීම (serving) සිදු කරයි

### 10.2. යුගල තරඟ සඳහා (Doubles)

10.2.1. යුගල තරඟයකදී මූලික වශයෙන් කණ්ඩායමකට හිමිවනුයේ එක් පිරිනැමුම් අවස්ථාවක් පමණි (one service only). පිරිනැම්ම (service) සිදු කිරීමත් සමග ඇරඹෙන අතුරු තරඟ වටය (rally) ඔවුන් පරාජය වු විට පිරිනැම්ම ලැබූ පිල (receiving side) නව පිරිනැම්ම සිදු කරන පිල (new serving Side ) බවට පත් වේ. (11.2.4 හා 10 පිටුව බලන්න)

10.2.2. තරඟ වටය (game) ආරම්භයේදී එනම්, ලකුණු තත්ත්වය 0 - 0 ( love all ) වන විට පිරිනැම්ම සිදු කරන කණ්ඩායමේ (serving side) දකුණු පැත්තේ (right service court ) සිටින ක්‍රීඩකයා තරඟවටය (Game) ආරම්භ කරයි.

10.2.3. **පිරිනැම්ම ලබන කණ්ඩායම (Receiving Side)** ලකුණක් ගත්විට (ලකුණු තත්ත්වය 1 - 0 ) , ඊලඟ තරඟ අතුරු වටයේදී (rally) ප්‍රථම වරට, වම්පැත්තේ (left service court) සිටින ක්‍රීඩකයා පිරිනැම්ම (service ) ආරම්භ කරයි.

10.2.4. **පිරිනැම්ම සිදු කරන කණ්ඩායම (Serving Side)** අදාල අතුරු තරඟ වටය (rally) ජයග්‍රහණය කළේ නම් ඔවුන්ට ලකුණක් ලැබෙන අතර, කලින් පිරිනැම්ම කල ක්‍රීඩකයා විසින්ම නැවත පිරිනැම්ම (next service) සිදු කළ යුත්තේ තෝරා ගැනිමට ඉතිරි වි ඇති (alternative) වම් පැත්ත හෝ දකුණු පැත්ත කොටුවේ (left service court or right service court ) සිටය. **(මෙම අවස්ථාවේදී පිරිනැම්ම ලබන පිල (Receiving Side ) ක්‍රීඩකයන්ගේ පිරිනැමුම් පැත්ත ( left / right Service Court) මාරුවීමක් සිදුනොවෙයි.**

( වැඩි විස්තර සඳහා 14 පිටුව බලන්න)

10.2.5. **පිරිනැම්ම ලබන කණ්ඩායම (Receiving Side )** අදාල තරඟ අතුරු වටය (rally) ජයග්‍රහණය කළ හොත් ඔවුන්ට ලකුණක් හිමි වන අතර ඔවුන් නව පිරිනැම්ම සිදු කරන පිල (New Serving Side ) බවට පත් වේ. ඔවුන්ගේ ලකුණු තත්ත්වය (එනම් ඔත්තේ හෝ ඉරට්ටේ ) අනුව, පිළිවෙලින් වම් පැත්තේ හෝ දකුණු පැත්තේ (Left Service Court or Right Service Court ) සිටින ක්‍රීඩකයා පිරිනැම්ම (Serving) සිදු කරයි.. **(මෙම අවස්ථාවේදී පිරිනැම්ම සිදු කරන කණ්ඩායම (Serving Side) හෝ පිරිනැම්ම ලබන පිල (Receiving Side ) ක්‍රීඩකයන්ගේ පිරිනැමුම් පැත්ත ( left / right Service Court) මාරුවීමක් සිදුනොවෙයි.** ( 14 පිටුව (a) ,(b), (d) , (e), (f) බලන්න )

10.2.6. එක් පිලක සිටින ක්‍රීඩකයින් දෙදෙනා හට තම පැති (Serving Courts) මාරු කරගත හැක්කේ තමන් විසින් පිරිනැම්ම (Service) සිදු කර ඇරඹුන අතුරු තරඟ වටය (Rally) ඔවුන් ජයග්‍රහණය කල විට පමණි. ( 14 පිටුව (c) හා (g) බලන්න )

## 11. විවේකකාල (Intervals) සහ පැති මාරුවීම් (Change Sides)*

11.1. තරඟයේ ඉහල ලකුණ (Leading Score) 11වන විට ක්‍රීඩකයන්ට **තත්පර 60 ක** විවේකකාලයක් හිමි වන්නේය.

11.2. තරඟ වට (Game) 2 ක් අතර (Between Each Games), **විනාඩි 2 (තත්පර 120) ක** විවේක කාලයක් හිමි වන්නේය.

11.3. 3 වන තරඟ වටයේදී (3 rd Game) තරඟයේ ඉහල ලකුණ (Leading Score ) 11 වන විට ක්‍රීඩකයන් පැති (Change Sides) මාරු කරගත යුතුය. (3 වන තරඟ වටයේදීද 11.1 නීතිය වලංගුවෙයි ).

## 12.වැරදි (Faults)

බැඩ්මින්ටන් තරඟයකදී පොදු වැරදි (common faults) කිහිපයක් ඔබගේ දැන ගැනීම සඳහා පහතින් දක්වමු.

12.1. 7 කොටසේ සඳහන් පිරිනැමීම් (service faults) වැරදි සිදුකල විට

12.2. 8.1 ඡේදයේ විස්තර කර ඇති පිරිනැමීම් පිටි වැරදි (service court errors) සිදුකල විට

12.3. ක්‍රීඩා අතුරු වාරයකදී (rally) ෂටලය (shuttlecock) ;

12.3.1. බැඩ්මින්ටන් පිටියේ අදාල සීමා ඉරි (boundary lines) වලින් **පිටත** පතිතවීම.

12.3.2. දැල ( net ) **හරහා** හෝ **යටින්** ගමන් කිරීම ප්‍රතිවාදියාට බාධා නොවන ලෙස පාදය දැල ( net ) යටින් ගමන් කල හැක ( 12.3.4 නීතියට පටහැනි නොවන ලෙස)

12.3.3. ක්‍රීඩකයන්ගේ හෝ ඔවුන්ගේ ඇඳුම්වල හෝ බැඩ්මින්ටන් පිටියට පිටින් අසල ඇති කුමන හෝ වස්තුවක (object) ෂටලය ස්පර්ශවීමකදී

12.3.4. ෂටලයට (shuttlecock) පහර වදින අවස්ථාවේදී (initial point of contact) බැඩ්මින්ටන් පිත්ත තමන්ගේ පැත්තේ **නොමැති** අවස්ථාවකදී (**not** strikers side of the net) : පිත්ත, ඇඳුම හෝ ශරීරයේ කුමන කොටසක් හෝ දැලෙහි (net) ස්පර්ශ වූවිට

12.3.5. ක්‍රීඩා කිරීමේදී ෂටලය (shuttlecock) බැඩ්මින්ටන් පිත්තේ රැඳීම නිසා

12.3.6. එකම ක්‍රීඩකයා විසින් එකවර පහරවල් 2 ක් (02 strokes) ගැසීම.

## 13.ක්‍රීඩා අතුරුවාරය (rally) නැවත ඇරඹීමට (Lets) ඉඩදීම

13.1. බලාපොරොත්තු නොවූ හදිසි අවස්ථාවකදී (උදා හදිසි අනතුරක්)

13.2. පිහාටු පන්දුව (shuttlecock) දැල උඩ පාවෙමින් සිට දැල (net) හරහා ගොස් දැලේ අනික් පැත්තේ රැඳීම (caught in the other side of the net) {**පිරිනැමීමකදී (service) හැර** }

13.3. පිරිනැමීම ලබන්නා (receiver) **සූදානම් වීමට පෙර** පිරිනැමීම සිදුකරන්නා (server) පිරිනැමීම ඉදිරිපත් කිරීම.

13.4. ක්‍රීඩා කිරීමේදී ෂටලයේ (shuttlecock) මුඩිය (knob/base) සම්පූර්ණයෙන්ම ගැලවී වෙන්වී යාම.

13.5. රේඛා විනිසුරු (line judge) සහ ප්‍රධාන විනිසුරු (umpire) දෙපලටම ෂටලය (shuttlecock) බැඩ්මින්ටන් පිටියේ ස්ථානගතවූ ආකාරය ගැන තීරණයක් දීමට නොහැකි අවස්ථාවකදී

## 14. පුහුණුකරුගෙන් (Coach) උපදෙස් ලබාගැනීමට හා පිටියෙන් පිටතට යෑම (Advice / Leaving Court )*

14.1. තරඟ අතුරු වටයක් (rally) අවසන්වී නැවත නව අතුරුවටයක් (new rally) පටන් ගැනීමට පෙර ඒ අතර කාලසීමාවේදී පමණක් (Only when the shuttle is **not** in play) ක්‍රීඩකයාට අවශ්‍ය නම් පිටියෙන් (court) පිටත ආසන්නව සිටින පුහුණුකරුගෙන් (coach) උපදෙස් ලැබීමට අවසර ඇත

14.2. එහෙත් උපදෙස් ලබාගැනීම හෝ ලැබීම හේතුකොටගෙන තරඟවටය අනවශ්‍ය පරිදි ප්‍රමාද වීමක් (delay) හෝ බාධාවක් (disturb) නොවිය යුතුය. එසේ පමාවක් හෝ බාධාවක් වුවහොත් ඒ පිළිබඳව අවවාද කිරීමට ප්‍රධාන විනිසුරුවරයාට (umpire) බලයක් ඇත.

14.3. අනුමත විවේක කාල වලදී හැර විනිසුරුගේ අවසරයක් රහිතව පිටියෙන් පිටතට යාමට ක්‍රීඩකයන්ට අවසර නොමැත.

## 15.රේඛා විනිසුරුවන්ගේ (Line Judges) හා පිරිනැමීමේ විනිසුරුගේ (Service Judge) තිරණ වෙනස් කිරීමේ බලය*

15.1. ඉහත විනිසුරුවන් ලබාදුන් තිරණ සාධාරණ නොවේ යැයි ප්‍රධාන විනිසුරුට (Umpire) සනාථ වන්නේ නම්, එම තිරණ වෙනස් කිරීමේ බලය ප්‍රධාන විනිසුරුට ඇත

## 16.විනිසුරුවරයාගේ වචන මාලාව (vocabulary)

**16.1. දළ විශ්ලේෂණය (overview)**

බැඩ්මින්ටන් තරඟයක් විනිශ්වය කිරීමේදි ප්‍රධාන විනිසුරු වරයාට (umpire) අමතරව පිරිනැමීම් විනිසුරු (service judge) සහ ඊට අමතරව රේඛා විනිසුරුවරුන් (line judges) 10 දෙනෙක් කටයුතු කරයි. 12 දෙනෙකුගෙන් සමන්විත එම කණ්ඩායම බැඩ්මින්ටන් පිටිය තුල ස්ථානගතවී ඇති අන්දම 12 පිටුව යටතේ නිරූපනය කර ඇත.

**16.2. වචනමාලාව (vocabulary) :-**

ප්‍රධාන විනිසුරු (umpire) විසින් තරඟයකදි භාවිතා කරන වචනමාලාවේ පොදු වදන් කිහිපයක් පහතින් ඉදිරිපත් කර ඇත.

<u>ක්‍රිඩකයන් හඳුන්වාදිම</u> :- ( පාසැල් 02 ක් අතර <u>යුගල තරඟයකදි</u> )

" Ladies and Gentlemen this is the semi- final match of men's doubles . On my right, Gothami Junior School Gampaha. represented by , Dinusha Senaviratne and Manuj Wijayaratne. On my left ,Bandaranayaka College , Gampaha. represented by Pubudu Tennakoon and Samith Gunathilaka " .

යුගල තරඟයකදි පිරිනැමීම කරන්නා (server) සහ පිරිනැමීම ලබන්නා (receiver) හඳුන්වා දෙන්න.
" Pubudu to serve to Dinusha"

" Love all ; Play "
සමඟම තරඟය ආරම්භවේ. තරඟයේ ලකුණු ප්‍රකාශයට පත්කිරීමේදි සෑම විටම පිරිනැමීම සිදුකරන්නා (server) ගේ ලකුණු <u>පළමුව</u> ප්‍රකාශයට පත්කල යුතුය.
" Service Over "
තරඟයකදි පිරිනැමීම සිදුකල ක්‍රිඩකයා (server) එක් තරඟ අතුරු වාරයක්දි (rally) පරාජයට පත්වූ විට ; යුගල තරඟයකදිද වලංගු වෙයි.
(උදා) :- " Service Over " ; Five (05) ; One (01)"

" 20 Match point 09 " / " 29 Match point 28 "
අවසාන වන ලකුණු වන, 21 ට <u>පෙර</u>, 20 වෙනි ලකුණ ලබාගත්විට
පලමු තරඟ වාරය ( 1 st game) ජයග්‍රහණය කල ක්‍රිඩකයාම දෙවන තරඟ වාරයේදි ( 2 nd game) ලකුණු 20 හෝ අවසන් ලකුණට පෙර ලකුණ ලබාගත්විට.

1 වන තරඟ වාරයේදි ( 1 st game) ජයග්‍රහණය කල ක්‍රිඩකයා වෙනුවට, අනික් ක්‍රිඩකයා <u>2 වන තරඟ වාරයේදි,</u> ලකුණු 20 හෝ අවසන් ලකුණට පෙර ලකුණ ගෙන ඇති අවස්ථාවකදි ;" ....... Match point ......." <u>වෙනුවට</u> " ... Game point ....." යනුවෙන් ප්‍රකාශ කරනු ලැබේ.

" 29 Game point All " / " 29 Match point All "
ක්‍රිඩකයන් දෙපිලම අවසන් ලකුණට පෙර ලකුණ ලබාගත්විට (ඉහත සඳහන් අවස්ථාවන් අනුව).

" Interval"
තරඟ වාරයේදී එක් පිලක් **ලකුණු 11** ක් ලබාගත් පසුව හිමිවන **තත්පර 60ක** විවේක කාලය ප්‍රකාශ කිරීම

" Court No. 1 ; 2 Minutes Interval "
තරඟ වාර (Game) දෙකක් අතර ලැබෙන තත්පර 120ක විවේක කාලය ප්‍රකාශ කිරීම

" Court No. 1 ; 20 Seconds "
තරඟ වාරයේදී එක් පිලක් **ලකුණු 11** ක් ලබාගත් පසුව හිමිවන **තත්පර 60ක** විවේක කාලය තුලදී **තත්පර 40 ක් අවසන් වනවාත් සමඟම දෙවරක්** දැනුම්දෙන්න.
තරඟ වාර (Game) දෙකක් අතර ලැබෙන තත්පර 120 ක විවේක කාලය තුලදී **තත්පර 100 ක් අවසන් වනවාත් දෙවරක්** දැනුම්දෙන්න.

" 1 st Game won by Pubudu and Samith " ; " Twenty One (21) ; Ten (10) "
1 වන තරඟ වාරය ( 1 st Game ) පුබුදු සහ සමිත් ක්‍රීඩකයන් නියෝජනය කල යුගලය (pair) ජයග්‍රහණය කලවිට

" One Game All "
දෙපිලම තරඟවාර (Games ) එක බැගින් ජයග්‍රහණය කලවිට

" Match won by Pubudu and Samith " ; " 21 , 10 ; 21 , 8 "
1 වන සහ 2 වන තරඟවාර දෙකම පුබුදු සහ සමිත් ක්‍රීඩකයන් නියෝජනය කල යුගලය ජයග්‍රහණය කලවිට

" Second game ; Love all ; Play "
(දෙවන තරඟවාරය ආරම්භ කිරීම)

" Final Game ; Love All ; Play "
3 වන සහ අවසාන තරඟවාරය ( 3 rd and final game) පටන් ගැනීම සඳහා)

" Change ends " 3 වන තරඟ වාරයේදී එක් පිලක් **ලකුණු 11 ක්** (කේවල/යුගල /මිශ්‍ර යුගල) ලබාගත් පසුව පිටියේ පැති (sides) මාරු කරගත යුතුය.

**යුගල තරඟයකදී (Doubles) විනිසුරුවරුන් 12 දෙනා ස්ථානගතවී ඇති ආකාරය හා පිටියේ සැකැසීම.**




A = ප්‍රධාන විනිසුරු (Umpire)

B = පිරිනැම්මී විනිසුරු (Service judge)

X = රේඛා විනිසුරුවන් (Line judges)

(Source: - BWF)

## 23. රේඛා විනිසුරුවන් (line judges) ප්‍රධාන විනිසුරු (umpire) සමග සිදුකරණ කරන සංඥා (signals)




( Shuttle is **OUT** )



( Shuttle is **IN** )



( If **UNSIGHTED** )

(Source :- BWF)

### පිරිනැමීම් විනිසුරු (service judge) විසින් ක්‍රීඩකයන් වැරදි ආකාරයට පිරිනැමීමක් (service fault) සිදුකරණ විට නිකුත් කරන සංඥා (signals)

සැ.යු. :- **service fault** එකක් පිළිඹඳ තීන්දුවක් ගැනීමට පෙර එම වැරැද්ද 100% වූ බවට Service Judge ට තහවුරු විය යුතුයි එසේ නොමැති විට **service fault** සංඥ නිකුත් නොකිරීමට වගට බලා ගනියි.



(a)



(b)



(c)



(d)



(e)

(Source :- BWF)

(a) = 7.1 (i) ජේදයෙ විසතර කර ඇත වැරදි ආකාරයට පරිනැමීම සඳුකරන විට (Service fault)

(b) = 7.1 (iii) ජේදයෙ විසතර කර ඇත වැරදි ආකාරයට පරිනැමීම සඳුකරන විට (Service fault)

(c) = 7.1 (iii) ජේදයෙ විසතර කර ඇත වැරදි ආකාරයට පරිනැමීම සඳුකරන විට **හෝ** පරිනැමීම කොටුව (service court) හි සීමා ඉරි (boundary lines) පෑගීම. (Service fault)

(d) = ක්‍රීඩකයන් සූදානම් වූ පසුව,පිත්තේ පළමුව ඉදිරියට ගෙන යන ඉරියව්ව (first forward action) පිරිනැමීම ආරම්භ කල බව සැලකේ. එම ක්‍රියාවලියේ වරදක්වූ අවස්ථාවකදී නිකුත් කරන සංඥාව (Service fault)

(e)= පිරිනැමීම සිදුකරණ ආරම්භක මොහොතේදී පිහාටු පන්දුවේ **මූඩිය** (base of the Shuttle cock) බැඩ්මින්ටන් පිත්ත (badminton racket) මත ඍජුව සම්බන්ධ නොවීම. (Service fault)

## 24. යුගල තරඟයක තරඟ අතුරු වට (rallies) කිහිපයකදී පිරිනැමුම් පැත්ත මාරුවීම හා ලකුණු හිමිවන ආකාරය Changing Service Court & Scoring in Doubles

(a) A සහ B පිලෙහි (Initial serving side) **A ක්‍රීඩකයා** තරඟ වටය ආරම්භයේදී C සහ D පිලෙහි (Initial receiving side) **C ක්‍රීඩකයාට** පිරිනැම්මක් (service) සිදුකරයි. ආරම්භක ලකුණු තත්ත්වය **0 – 0** (love all)




(b) C සහ D පිල තරඟ අතුරු වටය (rally)ජයග්‍රහණය කරයි.
ලකුණු තත්ත්වය **1 -0** (Service over : one - love)
C සහ D පිලෙහි ලකුණු සංඛ්‍යාව **ඔත්තේ** බැවින් වම් පිරිනැම්මි පැත්තේ (left service court) සිට **D ක්‍රීඩකයා** ( එනම් new server) **, B ක්‍රීඩකයාට** ( එනම් new receiver) පිරිනැම්මක් (service) සිදුකරයි.




(c) C සහ D පිල තරඟ අතුරු වටය (rally) ජයග්‍රහණය කරයි.
එවිට ලකුණු තත්ත්වය **2 – 0 (two- love)**
**මෙහිදී C හා D** ක්‍රීඩකයන් දෙදනා තම පිරිනැමුම් පැත්ත **( left / right Service Court)** මාරු කරයි **D ක්‍රීඩකයා** (server) වම් පිරිනැම්මි පැත්තේ (left service court) සිට **A ක්‍රීඩකයාට** ( එනම් new receiver) පිරිනැම්මක් (service) සිදුකරයි.




(d) A සහ B පිල තරඟ අතුරු වටය (rally) ජයග්‍රහණය කරයි.
එවිට ලකුණු තත්ත්වය **1 – 2** (Service over : one - two)
A සහ B පිලෙහි ලකුණු සංඛ්‍යාව **ඔත්තේ** බැවින් වම් පිරිනැම්මි පැත්තේ (left service court) සිට **B ක්‍රීඩකයා** ( එනම් new server) **, C ක්‍රීඩකයාට** ( එනම් new receiver) පිරිනැම්මක් (service) සිදුකරයි.




(e) C සහ D පිල තරඟ අතුරු වටය (rally) ජයග්‍රහණය කරයි.
එවිට ලකුණු තත්ත්වය **3 – 1** (Service over : three - one)
C සහ D පිලෙහි ලකුණු සංඛ්‍යාව **ඔත්තේ** බැවින් **වම්** පිරිනැම්මි පැත්තේ (left service court) සිට **C ක්‍රීඩකයා** ( එනම් new server) **, B ක්‍රීඩකයාට** ( එනම් new receiver) පිරිනැම්මක් (service) සිදුකරයි.




(f) A සහ B පිල තරඟ අතුරු වටය (rally) ජයග්‍රහණය කරයි.
එවිට ලකුණු තත්ත්වය **2 – 3** (Service over : two - three)
A සහ B පිලෙහි ලකුණු සංඛ්‍යාව **ඉරට්ටේ** බැවින් **දකුණු** පිරිනැම්මි පැත්තේ (right service court) සිට **A ක්‍රීඩකයා** ( එනම් new server) **, D ක්‍රීඩකයාට** එනම් new receiver) පිරිනැම්මක් (service) සිදුකරයි.




(g) A සහ B පිල තරඟ අතුරු වටය (rally) ජයග්‍රහණය කරයි.
එවිට ලකුණු තත්ත්වය **3 – 3 ( three all)**
**මෙහිදී A හා B** ක්‍රීඩකයන් දෙදනා තම පිරිනැමුම් පැත්ත **( left / right Service Court)** මාරු කරයි **A ක්‍රීඩකයා** (server) වම් පිරිනැම්මි පැත්තේ (left service court) සිට **C ක්‍රීඩකයාට** ( එනම් new receiver) පිරිනැම්මක් (service) සිදුකරයි.




වැඩි විස්තර සඳහා 9.2 හා 10.2 බලන්න

**ගම්පහ බැඩ්මින්ටන් සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රකාශනයකි**